**නැගෙනහිර පළාතේ පාලම් පහක් ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය - 2014**
---------------------------------------------------------------------------------

නැගෙනහිර පළාතේ පාලම් පහක් ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතියේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජපාන අන්තර්ජාතික සහයෝගීතා නියෝජිතායතනය අතර 2010 ජනවාරි 19 සහ 2010 නොවැම්බර් 25 දිනයන්හී එළඹී අංක 0961400 සහ අංක 1060720 දරන ප්‍රදාන ගිවිසුම් දෙක සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම , අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය
---------------------------------------------------------------------------

ව්‍යාපෘතියේ ප්‍රදාන ගිවිසුම් අනුව, එවකට වරාය සහ මහා මාර්ග අමාත්‍යාංශය වර්තමානයේ විශ්ව විද්‍යාල අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. නැගෙනහිර පළාත සමඟ මධ්‍යම පළාත හා නැගෙනහිර පළාතේ පනිච්චන්කනී වෙරළබඩ යා කරන ජාතික මහා මාර්ගයේ මාර්ග මං තීරු 02 ක් ලෙස වැඩි දියුණු කිරීමට මධ්‍යම හා සුළු ප්‍රමාණයේ පාලම් පුනරුත්ථාපනය මඟින් නැගෙනහිර පළාතට ප්‍රවේශ වීමේ මාර්ගය වැඩි දියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ප්‍රදාන ගිවිසුම් අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තු මුළු පිරිවැය රු.මිලියන 1,930 කට සමාන ජපන් යෙන් මිලියන 1,246 ක් වන අතර සම්පූර්ණ මුදල ජපාන අන්තර්ජාතික සහයෝගීතා නියෝජිතායතනය විසින් මූල්‍යනය කිරීමට එකග වී ඇත. ව්‍යාපෘතිය එහි කටයුතු 2010 පෙබරවාරි 09 දින ආරම්භ කළ අතර 2013 ජූනි 30 අවසන් කිරීමට නියමිත විය. කෙසේ වෙතත් 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කර තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම
----------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4. විගණකගේ වගකීම
--------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි

ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාල පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසනීයභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යනු ලබන මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති වියදම් සතුටුදායක ලෙස සංසන්දනය කර ඇති බව.

(ඇ) ශ්‍රී ලංකා රජය සහ ණයදීමේ නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ප්‍රදාන යටතේ කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ප්‍රදාන යටතේ කරන ලද ආපසු ගැනීම් ප්‍රදාන ගිවිසුම්වල දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුණේද යන බව,

(ඉ) ප්‍රදාන යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ, ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනාගෙන තිබුණේද යන බව

(උ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ

(එ) ප්‍රදාන ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**1.5 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම**

---

මෙම වාර්තාවේ 2.2 ජේදය දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

---

**2.1 මතය**

---

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිළි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 2.2 ජේදයේ දැක්වෙන කරුණු වලින් උද්ගතවන ගැලපීම් වලින් ඇති වන බලපෑම් හැර මාගේ මතය වනුයේ,

(අ) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව සහ

(ඈ) ප්‍රදාන ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

---

**2.2.1 ගිණුම්කරණ අඩුපාඩු**

---

සමාලෝචිත වර්ෂය තුළ ව්‍යාපෘතිය විසින් වැය කළ රු. මිලියන 2.36 ක් වූ ප්‍රචාරණ වියදම මූල්‍ය ප්‍රකාශනවල විවෘත කිරීමේ උත්සව වියදම් යටතේ දක්වා තිබුණි.

**2.2.2 නීති, රීති, රෙගුලාසිවලට අනුකූල නොවීම්**

---

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කොන්ත්‍රාත් ගිවිසුමේ 08 ව්‍යවස්ථාවට පටහැනිව කොන්ත්‍රාත්කරු වෙනුවෙන් රු. මිලියන 29.64 ක් වූ ආදායම් බදු ශ්‍රී ලංකා රජයෙන් ලද දායකත්වයෙන් ව්‍යාපෘතිය විසින් ගෙවා තිබුණි.

(ආ) 2000 අංක 38 දරන දේශීය ආදායම් බදු පනතේ හා 2000 ජනවාරි 31 දිනැති අංක පීඑෆ්/පීඊ/06 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය මඟින් සිදුකළ ප්‍රතිපාදනයන්ට පටහැනිව උපදේශකයන්ට ගෙවන ලද වැටුපෙන් අයකර ගැනීමකින් තොරව රු. මිලියන 8.22 ක් වටිනා උපයන විට බදු ව්‍යාපෘතිය විසින් ගෙවා තිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යනය හා සමාලෝචිත වර්ෂය තුළදී අයවැයගත ප්‍රතිපාදනය, සමාලෝචිත වර්ෂය තුළදි අරමුදල් උපයෝජනය හා 2014 දෙසැම්බර් 31 දිනට සමුච්චිත උපයෝජනය පිළිබඳ සැලකිය යුතු සංඛ්‍යා කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ප්‍රදාන ගිවිසුම්වල මූල්‍යනය කිරීමට එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ සිදුකළ වෙන්කිරීම | අරමුදල් උපයෝජනය | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුළ | | 2014 දෙසැම්බර් 31 දිනට | |
| | ජපන් යෙන් (මිලියන) | රු. (මිලියන) | රු. (මිලියන) | ජපන් යෙන් (මිලියන) | රු. (මිලියන) | ජපන් යෙන් (මිලියන) | රු. (මිලියන) |
| ජ.අ.ස.නි | 1,246 | 1,930 | - | - | - | 1,433.4 | 1,612.5 |
| ශ්‍රී.ලං.ර | - | - | 2.064 | 1.835 | 2.064 | 235.8 | 265.2 |
| | **1,246** | **1,930** | **2.064** | **1.835** | **2.064** | **1,669.2** | **1,877.7** |

### 3.2 භෞතික ප්‍රගතිය

ප්‍රගති වාර්තාවලට අනුව, නුවර - මහියංගණය - පදියතලාව මාර්ගයේ පාලම් 05 ක ප්‍රතිසංස්කරණ වැඩ 2013 ජුනි මාසයේදී අවසන් කර තිබුණු අතර ප්‍රතිසංස්කරණ වැඩවල අඩු පාඩු පිළිසකර කිරීමේ වගකීම් කාලයද 2014 ජුනි වලදී අවසන් විය. කෙසේ වෙතත් 2015 අගෝස්තු 31 දින වන විටත් ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීමේ වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි.

### 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) පනිවෙන්කනී පාලම ඉවත් කිරීමට කොන්ත්‍රාත්කරු වෙත රු. මිලියන 44.92 ට සමාන ජපාන යෙන් මිලියන 35.94 ක් ගෙවා තිබුණද, පාලම කඩා ඉවත් කිරීමෙන් ඉතිරි වූ ද්‍රව්‍ය මාර්ග සංවර්ධන අධිකාරිය වෙත බාර දී නොතිබුණි. එම ද්‍රව්‍ය නැවත භාවිතා කළ නොහැකි තත්ත්වයේ පැවති නිසා ඉවත් කර තිබුණු බව එවකට මහා මාර්ග, වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශ ලේකම් 2014 අගෝස්තු 05 වන දින පැහැදිලි කර තිබුණි. කෙසේ වෙතත් ඉවත් කළ ද්‍රව්‍ය ලැයිස්තුව හෝ ඒ සඳහා පූර්ව අනුමැතිය විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) පනිවෙන්කනී ඉදිකිරීම් වැඩ බිමෙහි තාවකාලික පාලමක් ලෙස කොන්ත්‍රාත්කරු විසින් භාවිතා කළ දිග මීටර 80 ක බේලි පාලමක ආකෘතිය හා ද්‍රව්‍ය, පාලම ඉදිකිරීමේ වැඩ සම්පූර්ණ කිරීමෙන් පසුව ව්‍යාපෘතියට හෝ මාර්ග සංවර්ධන අධිකාරියට භාර දී නොතිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය.

**3.4 ව්‍යාපෘති අරමුණුවලින් බැහැරව අරමුදල් උපයෝජනය**

----------------------------------------------------------

ශ්‍රී ලංකා රජයේ දායකත්වයෙන් ව්‍යාපෘතිය විසින් වැය කළ එකතුව රු. මිලියන 12.74 ක හෝටල් ගාස්තු හා ප්‍රචාරණ වියදම් ව්‍යාපෘති කටයුතුවලට සෘජුව සම්බන්ධ නොවූ ගනුදෙනුවකි.

**3.5 පසුගිය විගණනයේදී පෙන්වා දුන් නොවිසඳී ඇති විගණන නිරීක්ෂණ**

-----------------------------------------------------------------------

වැරදි විනිමය අනුපාත යොදා ගැනීම නිසා දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත 2013 දී වැඩිපුර ගෙවන ලද එකතුව රු. 534,617 ක එකතු කළ අගය මත බදු, 2014 දෙසැම්බර් 31 දින වන විටත් නැවත අය කර ගෙන නොතිබුණි.